**මොනරාගල ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**-----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 05 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 24 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 28 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මොනරාගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂයේ දී අයකරන ලද රු. 150,000 ක ගොඩනැගිලි සැලසුම් පෙරසැරි ගාස්තු ආදායමක් ලෙස ගිණුම්ගත නොකර තැන්පත් ගිණුමේ දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී නිසි ක්‍රියාමාර්ග ගෙන නිවැරදිව ගිණුම්ගත කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයට අදාල රු.107,335 ක පුනරාවර්තන වියදම් ගිණුම්ගතකර නොතිබුණු බැවින්, ගෙවිය යුතු වියදම් සහ වර්ෂයේ වියදම එම වටිනාකමින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී ගිණුම සැකසීමේදී නිවැරදි කරමි. |

**(ආ) නොසැසඳුණු පාලන ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉදිරිපත්කර තිබුණු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු ශේෂය රු. 4,872,912 ක් ලෙස දැක්වුනද නාගරික සංවර්ධන අධිකාරියේ ශේෂ තහවුරු කිරීමේ ලිපිය අනුව එම | ලේඛන හා උපලේඛන නිවැරදිව යාවත්කාලීන කර නොසැසඳීම් | වසර ගණනාවක සිට ගිණුම්ගත කර තිබුණු ශේෂයක් බැවින් එය තහවුරු කර ගැනීමට උපලේඛනයක් හෝ කාල විශ්ලේෂණයක් නොමැති අතර 2019.02.25 දින නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබුණු ශේෂ තහවුරු කිරීමේ ලිපිය අනුව ගෙවිය යුතු ණය මුදල සහ |

| | | |
|---|---|---|
| ශේෂය රු. 67,611,000 ක් වූ බැවින් රු. 62,738,088 ක වෙනසක් පැවතුණි. | වලට හේතු සොයා බලා නිවැරදි කළ යුතුවේ. | පොළිය රු. 67,611,000 ක් වේ. මෙම වටිනාකමේ ඇතුළත් පොළිය ඉවත්කර ගැනීමට කටයුතු කරමි. |

**(ඇ)** <u>**විගණනය සඳහා සාක්ෂි නොවීම්**</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------- | ------------ | ------------------------------------------ |
| රු. 26,598,993 ක වත්කම් විෂයයන් 3 කට අදාලව ශේෂ සනාථ කිරීම්, ගිවිසුම් පත්‍ර, උපලේඛන හා කාල විශ්ලේෂණ සහ රු. 4,872,912 ක වගකීම් විෂයකට අදාළව යාවත්කාලීන කරන ලද උපලේඛන හා කාල විශ්ලේෂණ ඉදිරිපත් නොකිරීම | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | අය කිරීමට තිබෙන වැඩ කපා හැරීමට විෂයභාර අමාත්‍යවරයා වෙත ලිපිලේඛන යොමු කර ඇති අතර හිඟ හිටි වෙනත් ආදායම් අවසන් ගිණුමෙන් කපා හැරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. කාල විශ්ලේෂණ මේ වන විටත් සකස් කරමින් පවති. නිරවුල් කළ යුතු ශේෂය ඉදිරි වර්ෂය තුලදී නිරවුල් කර ගැනීමට ක්‍රියාකරන අතර දැනටමත් රු.2,320,000ක් ගෙවා ඇත. |

**1.4** <u>**අනුකූල නොවීම්**</u>
<u>**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**</u>

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| ---------------------- | ----------------- | ------------- | -------------------------- |
| (අ) **<u>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත</u>** | | | |
| (i) 126 (vii)(උ) | අතුරු ව්‍යවස්ථා සකස්කර රථවාහන නැවතුම් ස්ථානවලින් ගාස්තු අය කිරීමට කටයුතුකර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා සකස් කර ගාස්තු අය කළ යුතුවේ. | අතුරු ව්‍යවස්ථා කෙටුම්පතක් සකස් කර ඇති අතර අනුමත කර ගැනීමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ග ගනිමි. |
| (ii) 136 වගන්තිය | බදු දී ඇති කඩකාමර 139 ක කුලිය තක්සේරුකර, එම තක්සේරු කුලිය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු කුලී අයකරගත යුතුවේ. | 2015 දී කළ තාවකාලික තක්සේරුවක් මත කුලී අයකරන අතර, නව තක්සේරු සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (iii) 139 වගන්තිය | වරිපනම් බදු අයකළ හැකි සීමාව තුළ පිහිටි බදු අයකළ හැකි සියළුම දේපල හඳුනාගෙන තක්සේරු කිරීමේ කාර්යය සඳහා වූ වාර වාර්තා ලබාගෙන නොතිබුණි. | දේපල හඳුනාගෙන තක්සේරු කිරීමේ කාර්යයන් සඳහා වාර වාර්තා කැඳවිය යුතුවේ. | සියළුම දේපල සඳහා වාර වාර්තා ලබා ගැනීමට අනුමැතිය ලැබී නොමැති අතර නව ඉදිකිරීම් සඳහා තාවකාලික තකසේරුවක් සිදු කරමි. |
| (iv) 149 වගන්තිය | ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ එම මණ්ඩලය අනුමතකර ඇති සභා බලප්‍රදේශයේ තිබෙන හෝටල් හා නවාතැන් පොළ 4කින් ගාස්තු අයකරගෙන නොතිබුණි. | අනුමත කර ඇති හෝටල් සහ නවාතැන් පොළවලින් ගාස්තු අයකරගත යුතුවේ. | සිහිකැඳවීම් ලිපි යොමු කර ඇති අතර නීතිමය පියවර ගැනීමට ආදායම් පරීක්ෂක දැනුවත් කර ඇත. |
| (ආ) **<u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය</u>** XXIV පරිච්ඡේදයේ 4 වගන්තිය | වර්ෂ 15 කට අධික කාලයක සිට පැවත එන සභාවේ සේවය කරන සේවකයින් 8 දෙනෙකු ගෙන් අයවිය යුතු එකතුව රු.260,307ක සේවක ණය අයකරගෙන නොතිබුණි. | අය විය යුතු සේවක ණය අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | තොරතුරු සොයාගත හැකි නිලධාරින් දැනුවත් කර ඇති අතර තොරතුරු සොයා ගැනීමට නොහැකි අනෙකුත් ශේෂ කපා හැරීමට පියවර ගනිමි. |
| (ඇ) **<u>2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අති විශේෂ ගැසට් පත්‍රය</u>** | 2015 වර්ෂයේදී අනුමත කර තිබුණු ගොඩනැගිලි සැලසුම් 56 කට අදාල ඉදිකිරීම් පරීක්ෂාකර හෝ අනුකූලතා සහතික නිකුත් කර හෝ නොතිබුණි. | ඉදිකිරීම් භෞතිකව පරීක්ෂාකර ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | සහතික ලබාගන්නා ලෙස ගොඩනැගිලි තාවකාලික තක්සේරු කිරීමේදී ආදායම් පරීක්ෂකවරුන් මඟින් දැනුවත් කිරීමට කටයුතු යොදා ඇති අතර ගොඩනැගිලි සැලසුම් අනුමත කරගෙන ඉදිකිරීම් කර ඇති සියළු දෙනා වෙත අනුකූලතා සහතික ලබා ගන්නා ලෙස දැනුම් දෙමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 13,289,271 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 23,853,827 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම රු. | 2018 බිල් කළ ආදායම රු. | 2018 රැස්කළ ආදායම රු. | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. | 2017 ඇස්තමේන්තුගත ආදායම රු. | 2017 බිල් කළ ආදායම රු. | 2017 රැස්කළ ආදායම රු. | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| (i) | වරිපනම් හා බදු | 12,869,609 | 11,970,956 | 6,227,817 | 5,743,139 | 13,226,173 | 11,945,130 | 5,138,154 | 6,806,978 |
| (ii) | කුලී | 12,583,950 | 2,610,077 | 2,608,135 | 1,942 | 16,385,419 | 2,531,500 | 2,506,583 | 24,917 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,045,100 | 1,353,900 | 1,359,900 | - | 960,200 | 1,263,850 | 1,263,850 | - |
| (iv) | වෙනත් ආදායම් | 1,089,000 | - | 20,405,302 | - | 9,988,000 | - | 16,458,842 | - |
| | එකතුව | 27,587,659 | 15,934,933 | 30,601,154 | 5,745,081 | 40,559,792 | 15,740,480 | 25,367,429 | 6,831,895 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට බිල්කරන ලද රු. 15,934,933 ක් වූ මුළු ආදායමින් වර්ෂය අවසාන වන විට රු. 5,745,081 ක් අයකර නොතිබුණු අතර එය මුළු බිල්කළ ආදායමෙන් සියයට 36 ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | හිඟ බදු කුලිය අයකරගෙන ඇති අතර හිඟ වරිපනම් බදු අයකර ගැනීමට විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන බව දන්වමි. |

**2.2.3** <u>වරිපනම් හා බදු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයට බිල් කරන ලද රු. 11,970,955 ක් වූ වරිපනම් බදු ආදායමින් දෙසැම්බර් 31 දිනට රු. 4,957,879 ක් රැස්කර නොතිබුණු අතර එය මුළු බිල් කළ වටිනාකමින් සියයට 41 ක් විය. | හිඟ වරිපනම් අයකර ගත යුතුවේ. | හිඟ මුදල් ගෙවා අවසන් කරන ලෙස අදාල ආයතන වෙත දන්වා ඇත. |
| (ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු. 18,653,059 ක් වූ හිඟ වරිපනම් බදු ආදායමින් වර්ෂය තුලදී රු. 11,385,191 ක් අයකරගෙන නොතිබුණි. එම අය නොකළ මුදල වර්ෂය ආරම්භයේ පැවති හිඟයෙන් සියයට 61 ක් විය. | හිඟ වරිපනම් අයකර ගත යුතුවේ. | මෙම හිඟය අයකර ගැනීමට ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර ඒ අනුව කටයුතු කරමින් ඇත. |
| (ඇ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.10,000ට වැඩි හිඟ වරිපනම් බදු ඒකක 159 කින් අයවිය යුතු මුදල රු.12,743,412 ක් විය. | හිඟ වරිපනම් අයකර ගත යුතුවේ. | රතු නිවේදන නිකුත්කර දේපල තහනමට ගැනීම් සිදු කරමින් වරිපනම් කොට්ඨාශ 6 ම ආවරණය වන පරිදි ජංගම සේවා පැවැත්වීමට කටයුතු කරමි. |

**2.2.4** <u>වාහන කුලියටදීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවට අයත් මෝටර් ග්‍රේඩරය කුලියටදීම වෙනුවෙන් 2012 වර්ෂය සඳහා රු. 66,220 ක් සහ 2014 වර්ෂය සඳහා රු. 5,000 ක් ලෙසට අයවිය යුතු රු. 71,220 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගත යුතුවේ. | අයකරගත නොහැකි මුදල් කපා හැරීමට විෂයභාර අමාත්‍යවරයා වෙත යොමු කරන අතර ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට පියවර ගනිමි. |

**2.2.5** <u>පීලෝන්කන්ද ජල ව්‍යාපෘතියෙහි ජල ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2015 වර්ෂයේ සිට අය නොවී පවතින රු.824,950 ක් වූ හිඟ ජල ගාස්තු අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | හිඟ ජල ගාස්තු අයකර ගත යුතුවේ. | හිඟ මුදල් අයකර ගැනීමට පියවර ගන්නා ලෙස ආදායම් පරීක්ෂක වෙත දන්වා ඇත. |

### 2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති උසාවි දඩ රු. 1,936,443 ක් හා මුද්දර ගාස්තු රු. 20,734,328 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩ සහ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | මෙම මුදල් ලබා දෙන ලෙස අදාල පාර්ශවයන් දැනුවත් කරමින් සිටිමි. |

### 2.3 අධිභාර

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව ඉකුත් වර්ෂයන් තුළදී පනවන ලද අධිභාර සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුදල රු. 989,893 ක් විය. | අදාල පාර්ශවයන්ගෙන් අධිභාර අයකර ගත යුතුවේ. | මියගිය පුද්ගලයන් සඳහා අධිභාර නිදහස් කර ගැනීමටත් ඉතිරි මුදල් අයකර ගැනීමටත් කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනවන විටත් ඉන් | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | ප්‍රමුඛ කාරණා සඳහා ඉදිරියේදී අතුරු ව්‍යවස්ථා සකස් කරමි. |

කාරණා 7 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

**(ආ)** **<u>ක්‍රියාකාරී සැලැස්ම</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබුණු අතර ඒ අනුව වර්ෂයේ ළඟාකර ගැනීමට අවශ්‍ය අරමුණු සහ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් හඳුනාගෙන නොමැති බව නිරීක්ෂණය විය. එම නිසා වාර්ෂික කාර්ය සාධනය ඇගයීමේ හැකියාව අහිමිවී ගොස් තිබුණි. | වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්මක් සකස්කළ යුතුවේ. | සිදු වූ අඩුපාඩුව නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

**(ඇ)** **<u>තිරසර සංවර්ධන ඉලක්ක</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | ඉලක්ක අඩුවැඩි මට්ටම් වලින් මේවන විටත් සපුරා ගැනීම සඳහා ක්‍රියාත්මක වී ඇත. |

## 3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | නගරයේ සියළුම රථ වාහන නැවතුම් ස්ථාන පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | සමීක්ෂණයක් කළ යුතු වේ. | මේ වන විට රථවාහන නැවතුම් ස්ථාන පිළිබඳව හඳුනාගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වරිපනම් බදු අය කිරීමට සුදුසු ප්‍රදේශ 2011 වර්ෂයේදී හඳුනාගෙන තිබුණු නමුත් කලින් කළ දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකර ගැනීමට සභාවේ අවධානය යොමුකර නොතිබුණි. | දියුණු කළ ප්‍රදේශ කලින් කළ හඳුනාගෙන වරිපනම් අයකර ගත යුතුවේ. | නගර සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමත් සමඟම වැඩි දියුණුකළ ගම් ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අය කිරීමට වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරමි. |
| (ඇ) | සභා බලප්‍රදේශය තුළ විවිධ ආයතන හා පුද්ගලයින් විසින් සමාලෝචිත වර්ෂයේදී ස්ථාපනය කර තිබුණු සියළුම ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරු ආවරණය වන පරිදි සම්පූර්ණ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | සභා බලප්‍රදේශය ආවරණය වන පරිදි සමීක්ෂණයක් කළ යුතු වේ. | ප්‍රධාන මාර්ගවල සවිකර තිබුණු පුවරු හඳුනාගත් අතර 2019 වර්ෂයේ පුවරු සවි කිරීමට අපේක්ෂාකළ අය කැඳවා නිදහස් කළ හැකි පුවරු ගාස්තු වලින් නිදහස් කරන ලදි. ඉතිරි අයගෙන් මුදල් අයකරන ලදි. ඉදිරියටත් එපරිදි කටයුතු කරමි. |
| (ඈ) | (i) සභාව විසින් නඩත්තු කරනු ලබන වීථි පහන් සංඛ්‍යාව, ඒවා පිහිටි ස්ථානය ආදිය හඳුනා ගැනීම සඳහා 2016 ජූලි 18 දිනෙන් පසුව වීථි පහන් සංගණනයක් සිදුකර නොතිබුණු අතර වීථි පහන් ස්ථාපිත කර ඇති ස්ථාන නිවැරදිව හඳුනා ගැනීම සඳහා වීථි පහන් ලේඛනයක් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | කඩිනමින් වීථි පහන් සංගණනයක් සිදු කර වීථි පහන් ස්ථාපිත කර ඇති ස්ථාන හඳුනාගත යුතු අතර, ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු වේ. | සංගණන වර්තාවක් නොමැති බවත් ලේඛනය යාවත්කාලීන කරගෙන යන බවත් දන්වමි. |
| | (ii) විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති චක්‍රලේඛය මගින් වීථි ආලෝකකරණය සම්බන්ධයෙන් නිකුත්කර තිබුණු උපදෙස් පිළිබඳව අවධානය යොමු නොකර වීථි ආලෝකරණ කටයුතු ක්‍රියාත්මක කර තිබුණු අතර මේ සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමග එකඟතාවයන් ඇතිකරගෙන ගිවිසුම්ගතවී නොතිබුණි. | චක්‍රලේඛය පිළිබඳ අවධානය යොමු කර ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගත විය යුතුවේ. | විදුලිබල මණ්ඩලය ලබා දෙන උපදෙස් අනුව ඉදිරියේදී කටයුතු කරමි. |
| (ඉ) | ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පිහිටි අනවසර ඉදිකිරීම් පිළිබඳව සමීක්ෂණයක් සමාලෝචිත වර්ෂය තුලදී සිදුකර නොතිබුණු නිසා එවැනි අනවසර ඉදිකිරීම් පිළිබඳව පූර්ණ හඳුනාගැනීමක් සිදුකිරීමට නොහැකි වී තිබුණි. | කඩිනමින් අනවසර ඉදිකිරීම් පිළිබඳව පූර්ණ සමීක්ෂණයක් සිදුකළ යුතුවේ. | සමීක්ෂණය සඳහා ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් නොමැති අතර නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සමඟ එක්ව ඉදිරියේදී සමීක්ෂණ කටයුතු කර නීතිමය කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 2012 වර්ෂයේ දී ආරම්භකර තිබුණු ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබාගෙන නොතිබුණි. | කඩිනමින් පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබා ගත යුතුවේ. | බලපත්‍ර ගාස්තු ගෙවා ඇතත් බලපත්‍රය ලැබී නොමැත. |
| (උ) | (i) වර්ෂ 1 කට වඩා වැඩි කාලයක සිට පැවත එන හඳුනා නොගත් හිඟහිටි වෙනත් ආදායම් රු. 5,260,292 ක් සමාලෝචිත වර්ෂයේදීද අයකරගෙන නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අයකර ගැනීමට නොහැකි මුදලක් සේ සලකා ගිණුමෙන් ඉවත් කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| | (ii) වර්ෂ 1 කට වඩා වැඩි කාලයක සිට පැවත එන නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු.4,872,912 ක ශේෂය සමාලෝචිත වර්ෂය තුලදී ද නිරවුල්කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | එයින් දැනට රු.2,320,000 ක් ගෙවා ඇති අතර ඉදිරියේදී ඉතිරි මුදල් ගෙවීමට පියවර ගනිමි. |

**3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 06 කට අදාලව අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සිටි සේවකයන් 23 දෙනෙකුගේ තනතුරු අනුමත කරගෙන නොතිබුණි. | අතිරික්ත කාර්ය මණ්ඩලයේ තනතුරු අනුමත කර ගත යුතුවේ. | අනුමත කාර්ය මණ්ඩල සංශෝධනය කර දෙන ලෙස ඉල්ලීම් කර ඇති අතර ගිනිබට නිලධාරීන් වෙනත් ආයතන වෙත යොමු නොකර තබාගැනීම සුදුසු බවත් දේශපාලන අධිකාරිය උපදෙස් ලබා දී ඇත. |

**3.4 <u>වත්කම් කළමනාකරණය</u>**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සභාවට අයත් අක්කර 122 පර්චස් 42 ක් වූ ඉඩම් කැබැලි 71 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතුකර නොතිබුණු අතර සභාව සතු ඉඩම් කැබැලි 69 ක මැනුම් කටයුතු කර නොතිබුණි. | සභාවට අයත් ඉඩම් මැනීම් කටයුතු කර නීත්‍යානුකූල අයිතිය පවරා ගත යුතුවේ. | අදාල ආයතන දැනුවත් කර ඉඩම් පවරා ගැනීමටත් මැනුම් කටයුතු කිරීමටත් කටයුතු කරමි. |

**3.5 වාහන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය අනුව සභාවට අයත් වාහන 15 ක ඉන්ධන දහනය පරීක්ෂාකර නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතුවේ. | වාහන කිහිපයක දැනටමත් ඉන්ධන පරීක්ෂාව සිදු කර ඇති අතර ඉතිරි වාහනවල ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර අවසන් කරන බවත් දන්වමි. |

**3.6 ප්‍රසම්පාදනය**

**ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රවර්තන වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් කර තිබුණු රු. 3,500,000 ක ඇතැම් ප්‍රාග්ධන වියදම් ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත්කර නොතිබුණි. මේ අනුව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමේදී අයවැය ලේඛනය කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | අනුමත අයවැය ලේඛනයට අනුකූලව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමේදී ඉදිකිරීම් ද ඇතුළත් කරමි. |

**3.7 කොන්ත්‍රාත් පරිපාලනය**

**ඉටු නොකළ කර්තව්‍යයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය මගින් ප්‍රාග්ධන වියදම් සඳහා රු. 39,500,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර, එහිදී නිශ්චිතව හඳුනාගෙන තිබුණු රු.13,300,000 ක ඇස්තමේන්තුගත වටිනාකමක් සහිත කර්මාන්ත 7 ක් ඉටු කිරීමට කටයුතුකර නොතිබුණි. | නිශ්චිතව හඳුනා ගෙන අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදන වෙන් කළ කාර්යයන් වර්ෂය තුළදී ඉටුකළ යුතුවේ. | දේශපාලන අධිකාරිය පැමිණීමත් සමඟ කර්මාන්තවලට ලබා දුන් ප්‍රමුඛතා වෙනස්වීමත් ඇතැම් කර්මාන්ත වෙනත් ආයතන මගින් සිදු කිරීමට තීරණය කිරීමත් මත සිදුකළ නොහැකි විය. |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව පිළියෙලකර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු කළ ආදායම් හා වියදම්, වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 4 ක සියයට 36 සිට සියයට 87 දක්වාද වියදම් විෂයයන් 7 ක සියයට 12 සිට සියයට 90 දක්වාද විචලනයන් පැවතුණි. | නිවැරදි අයවැය ලේඛනයක් පිළියෙල කර එහි ඇති ඉලක්ක සපුරා ගතයුතුවේ. | තාවකාලික තක්සේරු කිරීම් මගින් කුලී මුදල් වැඩිකිරීම,ව්‍යාපාරික ප්‍රජාව වැඩිවීම, කොම්පෝස්ට් පොහොර අලෙවිය අඩුවීම මගින් ආදායම් විෂයයන් වලද, ජාතික අයවැය මගින් වැටුප් වැඩිවෙතැයි අපේක්ෂා කිරීම, පුහුණු වැඩසටහන් අඩුවීම, උපකරණ පරිත්‍යාග ලෙස ලැබීම, ඇතැම් වැය විෂයයන් සඳහා අය වැය ඇස්තමේන්තු නොකිරීම, වැය විෂයයන්ගේ විචලනයන්ට හේතු වූ බව දන්වමි. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී සභාවේ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවේ. | ඉදිරියේදී අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා අභ්‍යන්තර විගණනයක් සිදු කරමි. |

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවෙහි චක්‍රලේඛ අංක ඩීඑම්ඒ/ 2009 (01) දරන 2009 ජුනි 9 දිනැති අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවිය යුතුවේ. | චක්‍රලේඛ ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුවක් ආරම්භ කරන බව දන්වමි. |